# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2015/47 - 2017 අප්‍රේල් මස 19 වැනි බදාදා - 2017.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

*යොමු අංකය* : කැප්‍රාලේ/අත්3/1/81.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංක* : 4-3/6/2014/HW/466.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

**අවශ්‍ය මහජන කාර්යය :-**

පාමංකඩ-හොරණ මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම යටතේ කි.මී. 5 +640 - 5+800 දක්වා මාර්ග කොටස සඳහා ඉඩම් අත්කර ගැනීම.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රත්තනපිටිය ගමේ පිහිටි කොට්ඨාස අංක 533 ඒ, රත්තනපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි සර්වේ ජනරල් වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2017.03.31 දිනැතිව පිළියෙල කරන ලද මූලික අංක කො. 9689 දරන පිඹුරේ හි සඳහන් කැබලි අංක 1 සිට 3 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0757 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (03).

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කොළඹ පාර, වරිපනම් අංක 1 දරන ඉඩම (කොටසක්); විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ල; අයිතිය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. ඩී. එස්. ප්‍රනාන්දු, අංක 1, ජී. එච්. පෙරේරා මාවත, රත්තනපිටිය, බොරලැස්ගමුව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0035.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: දවටගහ කුඹුර; විස්තරය: ගෙවත්ත, මිශ්‍රවගාවක් ඇත; අයිතිය: රජය, වේරුස්ගහ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගන්නා ලද කො 9468 දරන මූලික පිඹුරේ කැබලි අංක 13 කොටසක්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0366.

03. **කැබලි අංක 03**

ඉඩමේ නම: දවටගහ කුඹුර; විස්තරය: කුඹුර; අයිතිය: රජය, වේරුස්ගහ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගන්නා ලද කො. 9468 දරන මූලික පිඹුරේ කැබලි අංක 15, 16, 17 සහ 18 හි කොටස්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0356.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2017 මැයි මස 05 වැනි දින පූ.භා. 9.30 ට කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2017 අප්‍රේල් මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජී. එස්. කේ. කන්නන්ගර,
ප්‍රාදේශීය ලේකම් (*වැ.බ*)
හා අත්කර ගැනීමේ නිලධාරී,
කැස්බෑව,

2017 ක් වූ අප්‍රේල් මස 04 වැනි දින.
කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

05 - 117

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.